දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

සවිසා 2.1 - සම්භාව්‍ය සමාජවිද්‍යා න්‍යායේ පසුකාලීන වර්ධනය
SGYG 2.1 - Post Development in Classical Sociological Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. (අ) යුරෝපීය ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය සමාජ විද්‍යා න්‍යායේ වර්ධනය කෙරෙහි බලපෑම් කරන ලද්දේ කෙසේ ද?
(ලකුණු 06)

(ආ) කාර්මීකරණය හේතුවෙන් වෙනස් වූ යුරෝපියානු සමාජයෙහි සුවිශේෂතා පහක් (05) විස්තර කරන්න.
(ලකුණු 06)

(ඇ) කලාවේ පුනරුදය හා විද්‍යාවේ පුනරුදය, මනුෂ්‍යත්වය පදනම් කොටගත් සමාජයක් නිර්මාණය කරන ලද්දේ කෙසේදැයි පැහැදිළි කරන්න.
(ලකුණු 08)

02. (අ) කාර්මීකරණය හා ධනවාදය අතර කවර ආකාරයේ සම්බන්ධයක් පවතින්නේ ද?
(ලකුණු 06)

(ආ) ප්‍රබුද්ධත්වය (Enlightenment) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එහි ප්‍රධාන ලක්ෂණ පහක් (05) විස්තර කරන්න.
(ලකුණු 06)

(ඇ) සමාජවිද්‍යා න්‍යාය මගින් තත්කාලීන යුරෝපියානු සමාජයේ ස්වභාවය විග්‍රහ කළ ආකාරය පෙන්වා දෙන්න.
(ලකුණු 08)

03. (අ) ඔගස්ට් කොම්ටේ විසින් ඉදිරිපත් කරන ලද සමාජ ස්ථිතිකත්වය හා සමාජ ගතිකත්වය නැමති සංකල්ප උදාහරණ සහිතව හඳුන්වා දෙන්න.
(ලකුණු 06)

(ආ) යථානුභූතවාදය (Positivism) යනු කුමක්දැයි හඳුන්වා එහි ප්‍රධාන ලක්ෂණ 03 ක් විස්තර කරන්න.
(ලකුණු 06)

(ඇ) සමාජය ගතික ප්‍රපංචයක් ලෙස ඔගස්ට් කොම්ටේ ස්වකීය අවධි තුනේ නියාමය (The Law of Three Stages) මගින් පෙන්වා දෙන ආකාරය විස්තර කරන්න.
(ලකුණු 08)

04. (අ) සමාජ පරිණාමීය ක්‍රියාවලිය හර්බට් ස්පෙන්සර් පෙන්වා දෙන්නේ කෙසේ ද?
(ලකුණු 06)

(ආ) ඓන්ද්‍රිය සාදෘශ්‍යය යනු කුමක් දැ යි පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ඇ) ෆර්ඩිනන්ඩ් ටෝනීස් විසින් පෙන්වා දෙනු ලබන ගෙමයින්ෂාෆ්ට් හා ගෙසෙල්ස්ෂාෆ්ට් සංකල්ප පැහැදිලි කරන්න.
(ලකුණු 08)

05. (අ) කාල් මාක්ස් සමාජක්‍රමයක, ව්‍යුහීය ස්වභාවය විග්‍රහ කරනු ලබන ආකාරය පෙන්වා දෙන්න.
(ලකුණු 06)

(ආ) ඓතිහාසික භෞතිකවාදී න්‍යායාත්මක ප්‍රවේශය තුළින් සමාජ අවධීන් පරිණාමය වන ආකාරය මාක්ස් විස්තර කරන්නේ කෙසේ ද?
(ලකුණු 06)

(ඇ) සමාජ ක්‍රමයක ස්තරායන ස්වභාවය විග්‍රහ කිරීමේ දී "පන්තිය" ප්‍රධාන සාධකයක් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 08)

06. (අ) එමිල් ඩර්කයිම් සියදිවිනසාගැනීමේ ආකාර 04 ක් පෙන්වා දෙයි. ඒවා පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ආ) ආගම අධ්‍යාත්මික කරුණකට වඩා සමාජය තුළ ක්‍රියාත්මක වන සමාජ කරුණක් වන්නේ කෙසේ ද?
(ලකුණු 06)

(ඇ) එමිල් ඩර්කයිම් විසින් ඓන්ද්‍රිය ඒකාබද්ධතාව හා යාන්ත්‍රික ඒකාබද්ධතාව යනුවෙන් හඳුන්වා දෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 08)

07. (අ) මැක්ස් වෙබර්ට අනුව සමාජ පරිණාමය තුළ ආධිපත්‍ය ආකෘති තුනක් දක්නට ලැබේ. ඒවා පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ආ) ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම හා ධනවාදයේ නැගීම අතර පවතින සම්බන්ධතාවය කුමක් ද?
(ලකුණු 06)

(ඇ) ඔහු විසින් පෙන්වා දෙනු ලබන සමාජ ක්‍රියාවේ ප්‍රධාන ස්වරූපයන් මොනවාදැයි විග්‍රහ කරන්න.
(ලකුණු 08)

08. පහත සඳහන් ඕනෑම මාතෘකා 04 ක් සඳහා කෙටි සටහන් ලියන්න. (එක් පිළිතුරකට ලකුණු පහකි (05))

(අ) උපරි ව්‍යුහය හා පාදක ව්‍යුහය
(ආ) නිලබල ක්‍රමය
(ඇ) පරාරෝපණය
(ඈ) සමාජ කරුණු
(ඉ) කෘත්‍යවාදය
(එ) ශ්‍රම විභජනය



ඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉඉ